## විසර්ජන ශීර්ෂය 262 මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
## විගණකාධිපති වාර්තාව 2012 වර්ෂය

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යාම.

(ආ) ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මඟින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.

(ඇ) ප්‍රතිඵල ලාභිමුඛ ආකල්ප වගකීම් විචක්ෂණශීලී සම්පත් භාවිතය අපක්ෂපාතීත්වය විනිවිදභාවය ආදී සාර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.

(ඈ) රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

(ඉ) රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුව වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා , මණ්ඩල හා අධිකාරීන් මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ව්‍යාපෘති සංවිධානය කිරීම මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසු විපරම් කටයුතුවල සම්බන්ධීකාරකය ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

(උ) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික සමාජ හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ඔස්සේ ඉටුකර දීම.

(ඌ) දිස්ත්‍රික්කයේ රාජ්‍ය නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු රාජ්‍ය නොවන සංවිධානවලට නිවැරදි හා නිශ්චිත තොරතුරු, ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක්රැස්කර ඒකාබද්ධ කර සපයා දීම.

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රජයේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුන්ට හිමි ආදායම් එක් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

(ඒ) ගංවතුර, සුළිසුළං, නියඟ, මුහුද ගොඩගැලීම් වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම.

(ඉ) දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.

(ඊ) දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික ,ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

(ඔ) විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් සංවර්ධන කටයුතු සංවිධානය කිරීම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(ඕ) දිස්ත්‍රික් පරිපාලනයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් 16 දෙනා සමඟ කටයුතු මෙහෙයවීම.

(ක) දිස්ත්‍රික්කයේ ඵලදායීතාවය හා ගුණාත්මක භවය ඉහළ නැංවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඊට උනන්දු කිරීම.

(ග) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම අමාතයාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතනවල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

(ජ) සියළුම මැතිවරණ කටයුතුවලදී මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට කටයුතු කිරීම.

(ට) දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නිලධාරීන්ගේ හැකියා වර්ධනයට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

(ඩ) හදිසි ආපදාවලදී රජයේ නියෝජිතයා වශයෙන් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම.

(ක) විදේශ ආධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මඟින් වත්කම් කළමනාකරණ පද්ධති සවර්ධනය කිරීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) මාතර
(ආ) වැලිගම
(ඇ) කඹුරුපිටිය
(ඈ) හක්මණ
(ඉ) පස්ගොඩ
(ඊ) කොටපොල
(උ) මාලිම්බඩ
(ඌ) අකුරැස්ස
(එ) දික්වැල්ල
(ඒ) තිහගොඩ
(ඔ) මුලටියන
(ඕ) දෙවිනුවර

(ක) වැලිපිටිය
(ග) කිරින්ද පුහුල්වැල්ල
(ජ) පිටබැද්දර
(ට) අතුරලිය

## 1.3 විගණන විෂය පථය

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙක්තු වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 අගෝස්තු 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙක්තු සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් නොකිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුම් 05 කට හා 2010 වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුමකට 2013 මාර්තු 31 වනවිට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.3,415,368 ක් විය.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.817,443,208 ක්වූ අතර, වර්ෂය අවසාන වනවිට ඉන් රු.796,846,032 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.20,597,176 ක්වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.52 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 489,200,000 | 731,413,608 | 10,516,213 | 44 |
| මූලධන | 82,600,000 | 86,029,600 | 10,080,963 | 11.72 |
| එකතුව | 571,800,000 | 817,443,208 | 20,597,176 | 2.52 |

**(ii) ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම**

2012 වර්ෂයේදී 262-1-1-2104 වැය විෂය යටතේ රු.3,376,864 ක් වැයකර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආපන ශාලාව ඉදි කිරීමට රු.3,376,864 ක් ද අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු.1,932,728 ක් ද වැය කර තිබුණි. ඒ සඳහා මූලික ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන සළසාගෙන නොතිබූ අතර, පරිපූරක ඇස්මේන්තු වෙන් කිරීම් මඟින් හෝ ප්‍රතිපාදන ලබාගෙන නොතිබුණි.

**(iii) අයවැය විචලනය**

වැය විෂයයන් තැනක් සඳහා අධි ප්‍රතිපාදනය සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 9.2 ක් හා සියයට 14.4 ක් ගෙන තිබුණි.

**(iv) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 14 ක් විසින් එකතුව රු.3,586,493,292 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු.3,345,833,520 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිවීම් රු.240,659,772 ක් වී තිබුණු අතර එය ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 6.71 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද ප්‍රතිපාදනවලින් රු.101,551,547 ක් ඉතිරි වී තිබුණු අතර ගෙවීම සඳහා වවුචර් ඉදිරිපත් නොකිරීම මෙම ඉතිරියට හේතු වශයෙන් දක්වා තිබුණි.

- සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද ප්‍රතිපාදන වලින් රු.19,772,670 ක් ඉතිරි වී තිබුණු අතර අදල ප්‍රතිලාභ සඳහා නියමිත අක්මුදල් නොලැබීම හා පෝෂණ සහනාධාර සඳහා මුදල් නිදහස් කළත් ගර්භනී මව්වරුන් සංඛ්‍යාව මත වියදම් දැරීම මෙම ඉතිරියට හේතු වශයෙන් දක්වා තිබුණි.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද ප්‍රතිපාදනවලින් රු.62,778,043 ඉතිරිව තිබුණු අතර ඉල්ලන ලද මුදලට වඩා මුදල් ලැබීම මෙම ඉතිරියට හේතු වශයෙන් දක්වා තිබුණි.

- පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද ප්‍රතිපාදන වලින් රු.37,680,227 ක් ඉතිරි වී තිබුණු අතර අක් මුදල් නොලැබීම මෙම ඉතිරියට හේතු වශයෙන් දක්වා තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

විෂය අංක 26201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 50,500,000 | 47,959,975 | 35,000,000 | 40,713,962 | 180,000,000 | 178,895,000 |

විෂය අංක 26201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,908,402 ක් වූ අතර එය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.266,649,366 ක්වූ අතර වර්ෂ 2 ක් ඉක්මවා තිබුණු රු.261,749 ක්වූ තැන්පතු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, 2012 මාර්තු මස පිළයෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයක්ම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ල ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 1.6.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාලේග් ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම, සෑම අංශයක්ම ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2012 වර්ෂය සඳහා 2012 ජුනි 18 දින ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

**1.6.4 අභ්‍යන්තර විගණනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පැවතුණද මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාළව 2012 වර්ෂයේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**1.6.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් මාස 03 කට වරක් විගණනය හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, 2012 වර්ෂය තුළදී එම කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. විගණන හා කළමනාකරණ කමිටුව මඟින් වරින්වර ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ තීරණයන් බොහොමයක් 2013 ජුනි 06 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දිනය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිශ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් වාහන | 02 | අවුරුදු 03 |
| | | අවුරුදු 01 |
| වෙනත්<br>වතුර පිල්ටර් (පාවිච්චි නොකළ) | 32 | අවුරුදු 01 |

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි විහාරස්ථානයට අයත් හෙක්ටයාර් 5.42 ක් විශාල ඉඩම අධ්‍යාපන කටයුත්තක් වෙනුවෙන් රජයට පවරා ගැනීමේ කාර්යය සඳහා

1999 වර්ෂයේදි කටයුතු කර තිබූ අතර, එය 2013 ඔක්තෝබර් 31 දින දක්වාම නීත්‍යානුකූලව පවරා ගැනීමට සහ ඉඩම නිශ්චිතව කාර්යයක් වෙනුවෙන් යෙදවීමට අපොහොසත්වීම නිසා ඉඩම සංවර්ධනය සඳහා වැයකරන ලද රු.23,426,622 ක මුදල 2013 ඔක්තෝබර් 31 දින දක්වාම නිශ්කාර්යය වී තිබුණි.

## 1.8 අනුකූල නොවීම්

### 1.8.1 නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | (i) 2.8.4 මාර්ගෝපදේශය | 225,000,000 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවස්ථා 76 කදී රු.225,000,000 ක් වටිනාක ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණද අවස්ථා තුනකදී පමණක් තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ ලබාගෙන තිබුණි. |
| | (ii) 5.4.8 මාර්ගෝපදේශය | - | කොන්ත්‍රාත්කරුවන්ගෙන් කාර්ය සාධන සුරක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | - | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ අනවසරයෙන් බුක්ති විඳින රජයේ ඉඩම් කොටස් සඳහා බදු අයකිරීම කළයුතු වුවත් 2008 වර්ෂයේ සිටම එවැනි අනවසර ඉඩම් හිමියන් 17 දෙනෙකුගෙන් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. |

### 1.8.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෞද්ගලික සමාගමකට දුරකථන කුළුණක් ඉදිකිරීම සඳහා 2004 වර්ෂයේදී ඉඩපහසුකම් ලබාදී තිබුණද ඒ සඳහා බදුකරයකට එළඹීමට 2012

වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2013 ඔක්තෝබර් 31 දින දක්වාම කිසිදු බදු කුලියක් අය කර නොතිබුණි.

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ, මාතර දිස්ත්‍රික්කයේ බෙල් පෙපර් වගාව සඳහා ආරක්ෂිත ගෘහ ඉදිකිරීම වෙනුවෙන් 2012 ඔක්තෝබර් 10 හා 12 දිනයන්හි රු.347,292 ක මුදලක් වැයකර තිබුණි. වගාව සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නොවූ අතර, අලෙවිය සම්බන්ධව පැහැදිලි ක්‍රමවේදයක්ද නොවුණි. නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ ගොවීන්ගේ වගාවන් අසාර්ථක වී තිබුණු බව නිරීක්ෂණය වූ අතර, අස්වනු නෙලීම ද ඔවුන් විසින් අතහැර දමා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ආ) දිවිනැගුම වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රාදේශ 10 කින් ප්‍රතිලාභීන් 50 ක් තෝරාගෙන ව්‍යාපාරික ඇන්තූරියම් වගාව ඉලක්ක කර ඇන්තූරියම් පැල 5,000 ක් ලබාදීම සහ සෙවන දැල් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.5,000,000 ක මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම පරිදි අදාළ සැපයුම්කරු විසින් මැරීගිය පැල වෙනුවට නැවත පැල ලබාදිය යුතු වුවද, රු.295,200 ක් වටිනා පැල 1,476 ක් වෙනුවෙන් නැවත පැල සපයා නොතිබුණි. මෙහි අධීක්ෂණ කටයුතු නියමිත පරිදි සිදුවී නොතිබූ අතර, වගාකරුවන්ගේ වාර්තා හා පෞද්ගලික ආයතනයේ වාර්තා පරස්පර විය.

(ඇ) දිවිනැගුම වැඩසටහන යටතේ 2012 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබාදීම යටතේ රු.9,307,690 ක් වැයකර ප්‍රතිලාභී පවුල් 902 ක් සඳහා පැටවුන් 15,054 ක් බෙදාදී තිබුණු අතර මින් 3,658 ක් එනම් සියයට 25 ක් කුකුළු පැටවුන් විය. මේ අනුව බිත්තර සඳහා කිකිළි පැටව් ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ පවුලේ පෝෂණය හා ආර්ථිකය ඉහළ නැංවීමේ අරමුණ නිසි පරිදි ඉටුකර තිබූ බවට සාක්ෂි නොතිබුණි.

(ඈ) ගම නැගුම ව්‍යාපෘතිය යටතේ එක ගමකට එක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල අනුව 2012 වර්ෂයේදී අතුරලිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ යහමුල්ල කණිෂ්ඨ විදුහලට අයත් ඔලියගංකැලේ ආශ්‍රිතව අක්කර 05 ක පමණ භූමි ප්‍රාදේශය නිල්ල පිරුණු ගම්මානයක් ලෙස සංවර්ධනය කිරිම සඳහා රු.1,237,116 ක් වැයකර තිබුණද අපේක්ෂිත අරමුණ වශයෙන් හඳුනාගෙන තිබූ පළතුරු, ඖෂධ හා දැවමය වටිනාකමක් ඇති ශාක සිටුවීමේ කාර්යය නිසි අයුරින් සිදුවී නොතිබූ අතර පැල නඩත්තුවක්ද සිදුවී නොතිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතර ජාතික පාසලක පොකුණු ඉදිකිරීම සඳහා පාසල් සංවර්ධන සමිතිය වෙත 2012 ඔක්තෝබර් 24 දින රු.314,786 ක් ගෙවා තිබුණි. අදාළ කර්මාන්තය නව කර්මාන්තයක් ලෙස ඉටු කිරීමට 2012 අගෝස්තු 21 දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් රු.500,000 ක ප්‍රතිපාදන අනුමත කරවාගෙන තිබුණද, එම කාර්මාන්තය 2012 මාර්තු 08 දිනට පෙර ඉටුකළ යුතු කර්මාන්තයක් බව නිරීක්ෂණය විය. එසේම මෙම කාර්මාන්තය සඳහා පාසල් සංවර්ධන සමිතියට ගෙවීම් කර තිබුණද පාසල් සංවර්ධන සමිතිය මෙම කාර්යය ඉටුකළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි.

(ආ) කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට තහඩු මඩු 02 ක් සැපයීම වෙනුවෙන් 2011 දෙසැම්බර් 30 දින රු.145,500 ක් සැපයුම්කරුවෙකුට ගෙවා තිබූ අතර, සභාව විසින් පවත්වා තිබුණු තොග ලේඛනවල භාණ්ඩ ලැබීම් ලෙසද සටහන් කර තිබුණි. කෙසේ වුවද 2012 මාර්තු 31 දින සැපයුම්කරු විසින් ප්‍රාදේශීය ලේකම් වෙත එවන ලද ලිපියකින් මුදල් ගෙවා භාණ්ඩ රැගෙන යන ලෙස දන්වා තිබුණි. ඒ අනුව භාණ්ඩ ලැබුණු ලෙසට ව්‍යාජ සටහන් තොග ලේඛනයේ තබා ඇති බව ප්‍රාදේශීය සභාවේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී එක් තහඩු මඩුවක් පමණක් සපයා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය ශීර්ෂ 105 යටතේ මාතෘ සායන සඳහා රූපවාහිනී යන්ත්‍ර 35 ක් මිළදී ගැනීම වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දින රු.1,382,500 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශයට පටහැනිව ප්‍රසම්පාදන සංයුතිය සැකසී තිබුණි.
- ප්‍රසම්පාදන දැන්වීමේ 24" Flat model රූපවාහිනී යන්ත්‍ර සැපයීම සඳහා මිළගණන් කැඳවා තිබුණු අතර LCD 24" රූපවාහිනියක් සඳහා අවම මිළ වූ රු.39,599 ක් ඉදිරිපත් කර තිබුණු ආයතනය ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා නොගෙන LCD 22" රූපවාහිනියක් සඳහා රු.39,500 ක මිළ ඉදිරිපත් කර තිබුණු ආයතනයක් තෝරාගෙන තිබුණි.

(ඈ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාළව මාතෘ නිවාස සඳහා නව ගොඩනැගිලි 02 ක් ඉදිකිරීමට හා ගොඩනැගිලි 28 ක් අලුත්වැඩියා

කිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.80,636,234 කට මිළගණන් කැඳවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- මෙම ඉදිකිරීම් සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාගෝපදේශ සංග්‍රහයේ 3.2 මාගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර 2.8 මාගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද පත්කර නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත් 28 න් 17 ක් වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාර කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

- මාතර කාලිදාස පාරේ මාතෘ සායන ඉදිකිරීම සඳහා රු.6,402,040 ක අවම මිළගණන් ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන මිළ සමනය කර රු.6,402,040 කට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී රු.1,504,986 ක අමතර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම නිසා මුළු වියදම රු.7,907,026 ක් වී තිබුණු අතර, එය රජයේ ඇස්තමේන්තුව වූ රු.7,611,014 ද ඉක්මවා තිබුණි. තවද කොන්ත්‍රාත්තුව නිම කිරීම ද මාස 6 ක කාලයක් ප්‍රමාදවී තිබුණි.

## 1.11 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමේදී සිදුවන වන්දි ගෙවීම් ප්‍රමාදය හේතුවෙන් 2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රු.21,511,107 ක් හා රු.15,057,098 ක් වන්දි පොලී ගෙවා තිබුණි.

(ආ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහනවලට සිදුවී තිබුණු අනතුරු 19 කින් අනතුරු 14 ක අලාභ වටිනාකම රු.1,141,194 ක් ූ අතර අනතුරු 5 ක අලාභයන් ගණනය කර නොතිබුණි. මෙම අනතුරු සිදුවී වර්ෂ 10 ඉක්මවා තිබූ අවස්ථා ද වූ අතර, ඒ සම්බන්ධව මු.රෙ.103, 104, 105 අනුව විධිමත් පරීක්ෂාවන් කර වගකිවයුතු පුද්ගලයින්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වරෂයේ විසර්ජන ගිණුමට අදාළව ඩී.ජී.එස්.ඒ-7 ආකෘතියේ වසර 10 ට වැඩි පාඩු ලෙස රු.293,905 ක් දක්වා තිබූ අතර, මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව එම හානි පාඩු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්ාලයේ රු.1,664,200 ක මුදල් වංචාව හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිණි තැබීම සම්බන්ධයෙන් වූ ඇස්තමේන්තුගත හානි පාඩු 2013 මාර්තු 31 දක්වා නිරවුල් කර නොතිබූ අතර, ඒවා විසර්ජන ගිණුමේද දක්වා නොතිබුණි.

## 1.12 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කඩවර ගිංගස්වලයායේ ඇලවේල්ල පසු දමා සකස් කිරීම සඳහා රු.1,158,538 ක් වැයකර තිබුණි. වතුර බැසයාමේ නිසි ක්‍රමවේදයන් සකස් නොකිරීම හේතුවෙන් එම ඇල මාර්ගය හා කුඹුරුයාය ජලයෙන් යටවීම නිසා එම කුඹුරුයාය වී ගොවිතැන සඳහා යොදාගත නොහැකිවී තිබුණි.

(ආ) වැලිගම ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැලිගම ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිකිරීමේ කර්මාන්තය සැලසුමකින් තොරව සිදු කිරීම නිසා රු.2,563,756 ක්වූ මුල් ඇසේමින්තුව වරින්වර සංශෝධනය කර තිබූ අතර, එය රු.6,564,530 ද ඉක්මවා තිබුණි.

(ii) උක්ත ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 10 දෙනෙකු වසින් අවශ්‍යා ලියවිලි සම්පූර්ණ නොකර මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ අවධානය යොමු නොකර ප්‍රසම්පාදන කමිටුව විසින් එක් පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. අදාළ ආයතනය එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි ආයතනයක් නොවීම නිසා රජයට වාසිදායක බව ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණද, වරිනවර එකතු කළ අගය මත බදු ලෙස එම ආයතනයට රු.491,098 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) අදාළ කර්මාන්තය 2007 දෙසැම්බර් 12 දින වැඩ නිමකර භාරදීමට තිබුණද, එය භාරදී තිබුණේ 2008 නොවැම්බර් 26 දින එනම් මාස 11 ක ප්‍රමාදයකින් පසුවය. ඉදිකිරීම් මාස 11 යි දින 11 ක් ප්‍රමාදවී තිබුණු නමුත් ප්‍රමාද ගාස්තු අයකර තිබුණේ දින 52 ක් සඳහා රු.36,158 ක් පමණි. 2012 ඔක්තෝබර් 25 දින සිදුකළ භෞතික පරීක්ෂාව අනුව නිල නිවස වල්බිහිවී උළුවහු හා ජනෙල්, කෘමීන් විසින් විනාශ කර තිබූ අතර ගොඩනැගිල්ල තුළට වැසි ජලය කාන්දු වී විනාශ වෙමින් පැවතුණි.

## 1.13 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් දූර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) කඹුරුපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලයට අයත් රන්බිම ඉඩම්ලාභීන්ට භාරදීමට තිබූ රන්බිම ඔප්පු 08 ක් වර්ෂ 08 ක් තිස්සේ අදාළ ඉඩම්ලාභීන් වෙත භාර නොදී විෂයභාර නිලධාරියා භාරයේ තබාගෙන තිබුණි.

(ආ) වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පරෙවිදූව ඉඩම සංවර්ධන කටයුතු සඳහා 2009 වර්ෂයේ සිට වර්ෂ 5 සඳහා වර්ෂයකට රු.232,000 බැගින් හා ඉන්පසු බදු දීමනාකරු විසින් ඒ ඒ කාලසීමාව සඳහා නියම කරන ලද මුදලට, වර්ෂ 50 ක් සඳහා බදුදී තිබූ අතර, 2012 ඔක්තෝබර් විගණන දිනය වනවිටත් අදාළ පරිදි ගිවිසුමේ කොන්දේසි ඉටුවී නොතිබුණු අතර, ඉඩම සංවර්ධන කටයුතුද සිදුකර නොතිබුණි.

(ඇ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් 1997 වර්ෂයේ සිට මාසික බදු කුලිය රු.4,000 බැගින් සමූපකාර සමිතියකට බදුදී තිබූ නමුත්, එම සමිතිය 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය සඳහා බදුකුලී ගෙවා නොතිබුණි. හිඟ බදු කුලිය වූ රු.116,000 ක මුදල අයකිරීම සම්බන්ධයෙන්ද ප්‍රමාණවත් පරිදි කටයුතු කර තිබූ බවට සාක්ෂි නොතිබුණි.

(ඈ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2009 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා සුනාමි නිවාස ඉදිකිරීම්, මාතර කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා ජල සම්පාදන වැඩිදියුණු කිරීම සඳහා පවරා ගන්නා ලද ඉඩම් කැබලි 88 ක් 2012 වර්ෂයේ ඔක්තෝබර් දක්වාම ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඉ) අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසර 35 කට පෙර රජයේ සංවර්ධන කාර්යයක් වශයෙන් නිල්වලා යෝජනා ක්‍රමය සඳහා අත්පත් කර ගැනීමට කටයුතු කළ ඉඩම් 28 ක් සම්බන්ධ කටයුතු 2013 පෙබරවාරි 20 දින දක්වාම අවසන් කර නොතිබුණි.

## 1.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 59 | - |
| (ආ) | තෘතීයික මට්ටම | 34 | 26 | 08 |
| (ඇ) | ද්විතීයික මට්ටම | 1,137 | 916 | 221 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 145 | 137 | 08 |
| (ඉ) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනමට) | 05 | 05 | - |
| | එකතුව | 1,380 | 1,143 | 237 |

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති පුරප්පාඩු 237 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.